2023 පෙබරවාරි

# ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය 'MMCA Afterschool' තෙවන වාරය ආරම්භකරයි.

රටේ පළමු නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයවන ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා), එහි සන්දර්භය තුළ වයස අවුරුදු 6–10 අතර දරුවන්ට උත්තේජනාත්මක, විනෝදජනක, සහ සහයෝගී ඉගෙනුම් අත්දැකීම් සපයන මුලපිරීමක් ලෙස 2022 ඔක්තෝබර් මස MMCA Afterschool ආරම්භකළේ ය. පළමු වාරයේදී (2022 ඔක්තෝබර්–දෙසැම්බර්) ළමුන් 20 දෙනෙකුගේ සහ, දෙවන වාරයේදී (2023 ජනවාරි–පෙබරවාරි) ළමුන් 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන වාර දෙකක් සාර්ථකව සම්පූර්ණකර ඇත.

MMCA ශ්‍රී ලංකාහි අධ්‍යාපන ඩෙස්කුව මෙහෙයවන MMCA Afterschool, කෞතුකාගාරයේ බාහිර අධ්‍යාපනඥයින්ගේ (VEs) සහය ඇතිව ඉදිරිපත් කෙරෙයි. වැඩසටහනට මඟ පෑදූ සංකල්පීකරණය සහ සැලසුම්කරණය පිළිබඳව අදහස් දක්වමින්, "MMCA Afterschool වැඩසටහන ආරම්භවූයේ ‘කොළඹ පදනම් කරගත් නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයක් දරුවෙකුට ඇවැසි දෑ සපයන්නේ කෙසේ ද?' යන ප්‍රශ්නය සමගයි” යැයි පැවසූ සානුජ ගුණතිලක, අභිරක්ෂක ඉගෙනුම් සහ පුහුණු, තවදුරටත් සඳහන්කළේ, "ශ්‍රී ලංකාවේ ළමුන් පාසල්වල විෂය නිර්දේශ සහ ඇගයීම් මත පදනම්වූ 'කටපාඩම්කිරීම' අත්දකින ආකාරය නිරීක්ෂණයකිරීමේදී, විධිමත් අධ්‍යාපනික පසුබිම්වල දරුවන්ට ඔවුන්ගේ සමස්ත ජීවන කුසලතා වර්ධනයකර ගැනීමට අවකාශය සදන අවස්ථා ඉතා විරලබව අපට හැඟුණා. ඒ නිසා MMCA Afterschool ශ්‍රී ලංකාවේ දරුවෙකුගේ සමස්ත සංවර්ධන සහ ඉගෙනුම් අවශ්‍යතාවලට දායකවන, අධ්‍යාපනික නමුත් විනෝදජනක වැඩසටහනක් ලෙස ඉදිරිපත්කරනවා” යනුවෙනි.

MMCA ශ්‍රී ලංකාහි බාහිර අධ්‍යාපනඥයින්, පැය දෙක බැගින්වූ සැසි හතරක් පුරා දිවෙන සියලු ක්‍රියාකාරකම් හරහා දරුවන්ට මගපෙන්වයි. බාහිර අධ්‍යාපනඥයින්ට මේ වැඩසටහනින් ලැබෙන ඉගෙනුම් සහ පුහුණු අවස්ථා පිළිබඳ ආවර්ජනය කරමින් ගුණතිලක පැවසුවේ, "දරුවන්ට නවමු සහ

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

සිත්ගන්නාසුළු බවක් ඇතිකිරීමට MMCA Afterschoolහි සැසි එකිනෙකට සමාන නොවන ලෙස පවත්වයි. එහෙයින් අපගේ බාහිර අධ්‍යාපනඥයින් මෙම ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණකිරීම, සහ ඒවා නිර්මාණයකිරීම, මනාව සැකසීම, ඉදිරිපත්කිරීම, හා ඇගයීම සතිපතා සිදුකරනවා" යනුවෙනි. "ඉගැන්වීමේ පළපුරුද්ද ඇති මෙන් ම නොමැති බාහිර අධ්‍යාපනඥයින් ද මෙම අත්දැකීම් සහ නව භූමිකා භාරගෙන ඇති ආකාරය පිළිබඳව මම බොහෝ ආඩම්බරවෙනවා" යැයි ඇය තවදුරටත් පැවසුවා ය.

මෙම සැසිවලදී දරුවන් සංවාද, සංචාර, සාකච්ඡා, නිර්මාණාත්මක ලිවීම, වස්තු/කලා නිර්මාණය, චලන පදනම් කරගත් ක්‍රියාකාරකම්, නිදන් සෙවුම්, සහ තවත් බොහෝ දෑහි නිරතවෙයි. මෙම වැඩසටහන සම්බන්ධයෙන් දරුවන් සහ ඔවුන්ගේ දෙමව්පියන්/භාරකරුවන්/උපස්ථායකයින් දක්වන උද්යෝගය පිළිබඳව කතාකරමින් ප්‍රමෝදා වීරසේකර, සහය අභිරක්ෂක අධ්‍යාපන සහ මහජන වැඩසටහන් පැවසුවේ, "දෙමව්පියන්ගෙන් ලැබුණු පිළිගැනීම අපූරුයි. මෙම වැඩසටහන සපයන මගපෙන්වීම සහිත නිර්මාණාත්මක නිදහස පිළිබඳව ඔවුන් බොහෝ දෙනෙක් උද්යෝගයෙන් පසුවෙනවා. ඒ වගේ ම මෙම වැඩසටහන සමාජ අන්තර්ක්‍රියාකාරීත්වය අඩුවූ වසර තුනකට ආසන්න කාලයකට පසුව, ළමුන්ට එකට එක්වීමට සහ සමාජගතවීමට ද අවස්ථාවක් වෙනවා."

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි. අධ්‍යාපනය, විනෝදය, සහ නිර්මාණාත්මක නිරතවීම් යන මංසන්ධිවල සිට ඉගෙනුම් අත්දැකීම්වලට පහසුකම් සපයන අවකාශයක් ලෙස, MMCA ශ්‍රී ලංකා දරුවන්ට ශ්‍රී ලාංකීය නූතන හා සමකාලීන කලා සමග ගනුදෙනුකරමින් ඉගෙනීමේ නිරතවීමට කදිම සන්දර්භයකි. දෙමව්පියන්ට/භාරකරුවන්ට/උපස්ථායකයින්ට ඔවුන්ගේ දරුවන් සමග දිනපතා පෙ.ව 10–ප.ව 6 දක්වා කොළඹ 03, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාරය නැරඹීමට ආරාධනාකෙරෙයි. MMCA Afterschool පිළිබඳව වැඩිදුර දැනගැනීමට කැමති දෙමව්පියන්ට education@mmca-srilanka.org වෙත ඊමේල්කළ හැක.